ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

නිකුත් කළේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
දිනය 2013 මාර්තු 08 වැනි දින

**මුදල් ප්‍රතිපත්ති විවරණය - 2013 මාර්තු**

දේශීය ආහාර සැපයුමෙහි සහ පරිපාලිත මිල ගණන්වලට සිදු කරන ලද සැලකිය යුතු ගැලපීම්වල ඉතිරි වී ඇති බලපෑම් පිළිබිඹු කරමින් 2013 පෙබරවාරි මාසයේ දී වාර්ෂික ලක්ෂ්‍යමය උද්ධමනය සියයට 9.8 ලෙස නොවෙනස්ව පැවතුණි. කෙසේ නමුත් 2013 මාර්තු මස සිට උද්ධමනය පහත වැටෙනු ඇති අතර වසර අවසානය වන විට වඩා යහපත් මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. උද්ධමනය පසුගිය මාස 49 ක් මුළුල්ලේම තනි අගයක පැවති අතර යහපත් දේශීය සහ විදේශීය සැපයුම් තත්ත්වයන් සහ නිසි ලෙස සීමා කරන ලද සමාහාර ඉල්ලුම හේතුවෙන් උද්ධමනයේ යහපත් ඉදිරි දැක්ම තවදුරටත් පවතියි. උද්ධමනයේ අපේක්ෂිත පහත වැටීම නිසා පරිපාලිත මිල ගණන්හි සිදු කිරීමට බලාපොරොත්තු වන ගැලපීම්වලින් ඇති විය හැකි උද්ධමනකාරී පීඩනයන්ගේ බලපෑම අවම වනු ඇතැයි අපේක්ෂිතය.

2012 දෙසැම්බර් මාසයේ දී සිදු කරන ලද මුදල් ප්‍රතිපත්ති ලිහිල් කිරීමෙහි බලපෑම බැංකු පද්ධතියේ ණය දීම් තුළින් මේ දක්වාත් පිළිබිඹු නොවන බව පෙන්වමින් පෞද්ගලික අංශය වෙත ලබාදුන් ණය, එහි උච්චතම වර්ධන වේගය වූ 2012 මාර්තු පැවති සියයට 35.2 සිට (වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත) 2013 ජනවාරි වන විට සියයට 15.5 දක්වා තවදුරටත් පහත වැටුණි. කෙසේ වුවද, රාජ්‍ය අංශය විසින් ලබාගත් ණය ප්‍රමාණය ඉහළ යාම හේතුවෙන් 2012 දෙසැම්බර් මාසයේ පැවති සියයට 17.6 ක වර්ධන වේගයට සාපේක්ෂව පුළුල් මුදල් සැපයුම ($M_{2b}$) ජනවාරි මාසයේ දී සියයට 18.3 දක්වා ඉහළ

ගියේය. ආර්ථිකයේ අඛණ්ඩ වර්ධන ගම්‍යතාවට පහසුකම් සැලසීම සඳහා පවත්නා සමස්ත ඉල්ලුම ප්‍රමාණවත් බව ජනවාරි මාසයේ පැවති පුළුල් මුදල් ප්‍රසාරණයෙන් පිළිබිඹු වේ.

ඒ අතර, බලශක්ති අංශයේ අපේක්ෂිත මිල සංශෝධනයන් හේතුවෙන්, රාජ්‍ය ව්‍යවසායන් මූල්‍යනය සඳහා බැංකු අංශය මත රඳා පැවතීම අඩු කළ හැකි වනු ඇති අතර, එමගින් පෞද්ගලික අංශය වෙත අතිරේක සම්පත් ගලා යනු ඇත. මෙම තත්ත්වය නිසා පෞද්ගලික අංශයට එහි ආයෝජන මට්ටම ඉහළ නැංවීමට හැකි වී, රජය විසින් මෑත කාලයේ දී වැඩි දියුණු කර ඇති භෞතික යටිතල පහසුකම් භාවිතයෙන්, ආර්ථික කටයුතු ප්‍රසාරණය වීමට දායක විය හැකි වෙයි.

මේ අතර, මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණයෙන් මාස දෙකකට පසුවත්, තැන්පතු සහ ණයදීම් සඳහා අදාළ පොලී අනුපාතික තවදුරටත් ඉහළ මට්ටමක පැවතීම අවධානය යොමු කළයුතු කරුණක්ව තිබේ. කෙසේ වුවද, ප්‍රධාන වාණිජ බැංකු සමග මහ බැංකුව මෑතක දී පැවැත්වූ සාකච්ඡාවලට අනුව තැන්පතු අනුපාතික සහ ණයදීමේ අනුපාතික මුදල් ප්‍රතිපත්තියේ මගපෙන්වීමට සමගාමීව ගැලපුම් කරනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙවැනි ගැලපුම් සිදුකිරීමෙන් 2013 වර්ධන ඉලක්කයන් ළඟාකර ගැනීමට ප්‍රමාණවත් පරිදි පෞද්ගලික අංශයේ ආර්ථික කටයුතු පෙළඹෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

වර්ෂය තුළ මේ දක්වා ගෙවුම් ශේෂය අතිරික්තයක් වාර්තා කර ඇති අතර, 2013 වසර සඳහා සමස්ත වශයෙන් ප්‍රමාණවත් අතිරික්තයක් පවතිනු ඇතැයි අපේක්ෂිතය. විදේශ විනිමය වෙළෙඳපොළින් ශ්‍රී ලංකා මහ බැංකුව එ.ජ.ඩොලර් මිලියන 486 ක් ශුද්ධ වශයෙන් මේ වසර තුළ මිලට ගත් නමුත්, රාජ්‍ය ණය වෙළෙඳපොළ සඳහා විදේශ විනිමය ගලාඒම්, සංචාරක ආදායම් සහ පෞද්ගලික සංක්‍රාම ඉහළ යාම නිසා විනිමය අනුපාතිකය වඩා ස්ථායීව පැවති බව පෙනෙයි.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගනිමින් 2013 මාර්තු 07 දින පැවති සිය රැස්වීමේ දී දැනට පවත්නා මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය තවදුරටත් එලෙසම පවත්වා ගැනීම සුදුසුයැයි මුදල් මණ්ඩලය තීරණය කළ බැවින් මහ බැංකුවේ ප්‍රතිමිලදීගැනුම් අනුපාතිකය හා ප්‍රතිවිකුණුම් අනුපාතිකය පිළිවෙළින් සියයට 7.5 හා සියයට 9.5 ක් ලෙස නොවෙනස්ව පවතිනු ඇත.

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත්කරනු ඇත.